# අපරාධ සම්බන්ධයෙන් පැන නගින දඬුවම යුක්තිසහගත ද ?

**හරිනි නවෝදා ද සොයිසා**

සමාජයේ පවතින නීතියට හෝ සදාචාරයට පටහැනිව සිදු කරනු ලබන ක්‍රියා අපරාධ ලෙස හඳුන්වාදිය හැක. නොඑසේ නම් යම් අවස්ථාවක අන් අයගේ අයිතිවාසිකම් නිශේධනය කරනු ලබන්නේ නම් එය අපරාධ ලෙස සැලකිය හැක. නීතිමය විග්‍රහයට අනුව අපරාධයක් යනු නීතියෙන් සුවිශේෂී ලෙස තහනමට ලක් කොට ඇති යම් ක්‍රියාවක් හෝ පහර ගැනීමකි. අපරාධය යන්න විවිධ විද්වතුන් විවිධ ලෙසට අර්ථකථන කර තිබේ. ඩී. ආර්. ටැප්ටන් පවසන්නේ,

"පුද්ගල ක්‍රියා අපරාධ ලෙස සැලකිය හැකි බවත්, ඒවා නීතිය තුළින් තහනමට ලක්කළ යුතු බවත්ය."

එක් අපරාධයක් සම්බන්ධයෙන් එක් හේතුවක් ද, තවත් අපරාධයක් සම්බන්ධයෙන් තවත් හේතූන් ද බලපායි. මේ නිසා අපරාධ සම්බන්ධයෙන් පොදු බවක් ඉදිරිපත් කිරීම ගැටලු සහගතය.

ජී. අපනාසියෝ අපරාධ විද්‍යාවේ මූලධර්ම තුළින් දක්වන්නේ,

"අපරාධයක් යනු මිනිසා ක්‍රියා කරන හා ජීවත් වන යථාර්ථවාදී ලෝකය තුළ නිදහසේ ගොඩනැගෙන්නක් නොව, එය සමාජ තත්වයකි. මිනිසා විසින් අපරාධ සිදු කෙරේ."

ජේම්ස් ස්ටෙපන් "අපරාධ නීතියේ ඉතිහාසය" නම් කෘතියෙන් පෙන්වා දෙන්නේ,

"යම්කිසි අපරාධයක් සිදුවුවහොත් ඊට දඬුවමක් අයත් වන බවත්, යම් අපරාධයකට දඬුවම් දීමේ දී ඔහුගේ වයස, මානසික තත්ත්වය අවධානයට ලක් කළ යුතු බවයි."

යම් සංදර්භයක අපරාධයක් සිදුවේ නම් එතැන දඬුමක් ද තිබිය යුතුයි. මේ නිසා රාජ්‍ය සංස්ථාව ස්වකීය සාමාජිකයන් වෙත බලපාන එක් අංශයක් ලෙස දඬුවම් පැමිණ වීම දැක්විය හැක. රාජ්‍යය විසින් සදාචාරාත්මක කටයුතු සඳහා ඍජු මෙන්ම වක්‍ර බලපෑමක් සිදු කරනු ලැබේ. ස්වඡන්දයෙන් ක්‍රියා කරන පුද්ගලයන් ඇති සමාජයක දඬුවම සාධාරණ වන්නේ යයි තර්ක ඉදිරිපත් කරන විද්වතුන් රැසකි. සමාජයක ජීවත් වන පුද්ගලයන්ට දඬුවම් ලැබෙන්නේ වැරදි කිරීම හේතු කොට ගෙනය. එසේම පුද්ගලයන් වරදට පෙළඹෙන්නේ වරද නිසා නොව සමාජ, ආර්ථික හා මානසික කරුණු නිසා බව ඇතමුන්ගේ අදහසයි. එහෙත් මෙවැනි කරුණු සමාජයේ නියති වාදයක් පවතින බව තහවුරු කිරීමට ආධාර වී ඇත.

සදාචාරාත්මක වශයෙන් වගකීම පැවරීමට නම් එම පුද්ගලයා ඒවා ස්වඡන්දතාවෙන් සිදු කළ යුතුය. පුද්ගලයකුට දඬුවම් පමුණුවන විට එම පුද්ගලයා වරදක් කළාය යන අභ්‍යුපගමය වෙත එළඹීම සාමාන්‍ය සිරිතකි. මෙසේ නිගමනය කිරීමට ආධාර වන්නේ රාජ්‍ය සංස්ථාවේ ගොඩනඟා ඇති නීතියයි. ඒ අනුව පුද්ගලයාට දඬුවම් පමුණුවීම සිදු කරයි.

උදා :- යම් පුද්ගලයෙකු සොරකමක් සඳහා චූදිතයෙකු වී සිටී නම් ඔහු අත්අඩංගුවට ගැනීම.

යම් පුද්ගලයෙකු මිනීමැරුමක් කළේ නම් වසර කීපයක් සඳහා ඔහු බන්ධනාගාර ගත කිරීම.

මේ අනුව පෙනෙන්නේ යම් පුද්ගලයෙකු කරනු ලබන අපරාධයට සාපේක්ෂව දඬුවම තීරණය වන බවයි. ඒ අනුව සමාජ ස්ථාවරත්වය මුල් වන්නේ නීතිය බව පෙනේ. අර්නස්ට් බාකර්ගේ මතය අනුව පුද්ගලයින්ගේ ක්‍රියාවලීන් 99% ක් ම පොදු එකඟතාවය මත සිදුවන ඒවාය. තම පොදු අභිලාෂයන් සපුරා ගැනීමට පුද්ගලයන් නීතිය භාවිතා කරයි. එහෙත් එය සෑම විටම රටේ සුභසිද්ධියට ඉවහල් වන්නේ ද යන්න ගැටලුවකි. කෙසේ වුවත් පුද්ගලයින් මෙම නීතියට ඇති බිය නිසා වැරදි කිරීමට බිය දක්වයි. මේ පිළිබඳව මැකියාවෙලි පවසන්නේ,

"රාජ්‍ය සංස්ථාවේ සාමාජිකයන් නීතියට බිය වීමට වඩා ගෞරව කළ යුතු බවයි."

කෙසේ වුව ද පොදු නිෂ්ටාව නිශේධනය කරනු විට එය උල්ලංඝනය කරන්නන් හට දඬුවම් පැමිණ වීම යුක්ති සහගත යයි අගය කිරීමට සිදුවේ.

සමාජයේ පවත්නා විවිධ හේතු යම් යම් අපරාධයන්ට මඟ පාදන බව ඉදිරිපත් කොට ඇති එක් මතයකි. දූෂිත සමාජය, ආර්ථික පරිහානිය, දේශපාලන ව්‍යාකූලතාවයන්, මානසික ආතතිය, අධ්‍යාපනය නොලැබීම යන කරුණු ඒ අතර වේ. එම නිසා අපරාධ සඳහා වගකිව යුත්තේ සමාජය බවත් එහෙයින් අපරාධ සඳහා දඬුවම් පැමිණවීම සාධාරණ නොවන බවත් සමහරුන්ගේ අදහසයි. දඬුවමින් අප බලාපොරොත්තු වන්නේ සමාජයේ ස්ථාවර බව ආරක්ෂා කිරීමයි. මෙහිදී නීතියේ මෙහෙකරුවා ලෙස ක්‍රියා කරන්නේ බලයයි. මේ පිළිබඳව එමානුවෙල් කාන්ට් පවසන්නේ,

"සෑම අපරාධකාරයෙකුටම දඬුවම් දිය යුතු බවයි."

ටෙම්පල් පවසන්නේ,

"දඬුවම් ක්‍රමයකින් වරදකරුවා මනුෂ්‍යයෙක් බවට පත්වේ. දඬුවම මනුෂ්‍යයා නිෂ්ඨාවක් ලෙස සලකයි. ඔහුගේ මනුෂ්‍යත්වය ද සදාචාරමය වගකීම ද ඉන් පිළිබිඹු වේ."

මෙයින් පැහැදිලි වන්නේ දඬුවම් කිරීමෙන් වැරදි කළ පුද්ගලයෙකු සකසා ගත හැකි බවය.

වර්තමානයේ පමණක් නොව ආදි මානව යුගවල සිටම දඬුවම ක්‍රියාත්මක කරන ලදී. පැරණි මානව සමාජ වල විශේෂයෙන් ගෝත්‍රික යුගයන් වල පවා අපරාධයක් සඳහා දඬුවම් නියම කළ බව මානව විද්‍යාඥයින්ගේ අධ්‍යයන වලින් හෙළිවේ. එය මැලිනොව්ස්කි විසින් රචනා කරන ලද "වනචාර සමාජයේ අපරාධය හා සිරිත" යන කෘතියෙන් පැහැදිලි වේ. එසේම ආසියා හා අප්‍රිකානු රටවල ද ඉතා පැරණි වූ කෲර දඬුවම් ක්‍රම පැවතුණු බවට සාක්ෂි ඇත. සමහර දඬුවම් ක්‍රම මිලේච්ඡ කිඹුලන් බිලිදීම, දියේ ගිල්වා මැරීම, කස පහර දීම, හිස ගසා දැමීම ඒවා අතර වේ. පුද්ගලයෙකුට මරණ දණ්ඩනය දීමේ මූලික පරමාර්ථය අන් සමාජ පුරවැසියන්ට එමඟින් යහපත් ආදර්ශයක් ලබාදීමයි. වරදක් කළොත් ඒ සඳහා මරණ දණ්ඩනය පවා ලැබීමට ඇති ඉඩකඩ ගැන මහජනයා දැන සිටිය යුතු බව මින් ප්‍රත්‍යක්ෂ කර දෙයි.

සමාජ චර්යාවක නිරත වන සෑම පුද්ගලයෙකුටම ස්වඡන්දතාවයක් ඇති බවත් ඒ නිසා තමන් විසින් කරන ක්‍රියා සඳහා පුද්ගලයන් වගකිව යුතු බවත් ඇතැම් ආචාරවාදීන් දක්වා ඇති මතයකි. එහෙත් අපරාධ වල පෙළඹෙන බොහෝ පුද්ගලයන් එම තත්ත්වයට පත් වන්නේ සමාජයමය හේතු නිසා බවත් එම නිසා යම් නියත වීමක් අපරාධකරුවන් බිහිවීමට බලපාන බවත් දක්වා තිබේ. එයට හේතුව සමාජයක පොදුවේ පිළිගත් හොඳ නරක සෑම පුද්ගලයෙකුටම පිළිගැනීම අවශ්‍යයෙන් ම බැඳී ඇති බැවින් ඒ අනුව හැසිරිය යුතු වන නිසාය. මෙයින් පැහදිලි වන ප්‍රධාන කරුණක් නම් අපරාධකාරයෙකු විසින් දඬුවම් ලබා ගැනීමට අයිතියක් පෙන්නුම් කරන බවයි.

උදා:- මිනීමරුවෙකුට මරණීය දණ්ඩනය නියම කිරීම.

ළමා අපචාර සිදු කළ පුද්ගලයෙකුට ජීවිතාන්තය දක්වා සිර දඬුවම දීම.

ස්ත්‍රී දූෂණ සඳහා වරදකරුවෙකු වුවකු බරපතල වැඩ සහිතව වසර ගණනාවක් හෝ ජීවිතාන්තය දක්වා සිරගත කිරීම.

සමාජ පරිණාමයට අනුව නීතිය වැදගත් වූ අතර නීතිය කඩකරන්නන් හට එම ක්‍රියාවලියට සාපේක්ෂව දෙනු ලබන දඬුවම ප්‍රධාන මූලධර්ම කීපයක් ඔස්සේ සම්බන්ධ වෙමින් පවතී.

- දඬුවම පළිගැනීමක් වශයෙන්
- දඬුවම බය ගැන්වීමක් වශයෙන්
- දඬුවම චරිත ශෝධනයක් වශයෙන්
- දඬුවම සමාජ ඒකාබද්ධතාවය ආරක්ෂා කරන්නක් වශයෙන්

නමුත් ගැටලුව වන්නේ සදාචාරාත්මක වශයෙන් පුද්ගලයෙකුට දඬුවම් කළ හැක්කේ කවර පදනමක් මත ද යන්නයි. වැරදි වලට දඬුවම් කිරීම පිළිබඳව දාර්ශනිකයන් අවධාරණය කරනු ලබන කරුණු කීපයක් ඇත.

- වරදකරු නියම වශයෙන් වැරදිකරුවෙක් ද ?
- වැරදිකරුට දඬුවම් කිරීමෙන් කුමක් බලාපොරොත්තු වන්නේද ?
- අපරාධ සම්බන්ධයෙන් පුද්ගලයාට වගකීම පැවරිය හැකිද ?
- දඬුවම සාධාරණීකරණය කළ හැකිද ? ඒ කවර දෘෂ්ටියකින් ද ?

යම් අවස්ථාවකදී කිසියම් පුද්ගලයෙකු යම් අපරාධයක් සඳහා වැරදිකරුවා ලෙස චෝදනා ලැබ සිටියද නියම වශයෙන් ඔහු වැරදිකරුවා ද යන්න සොයා බැලීම ගැටලු සහගත තත්ත්වයක් උදා කරයි.

උදා :- A නැමති පුද්ගලයා විසින් B නැමති පුද්ගලයා ඝාතනය කර එතැනින් පලා යයි. ඒ මොහොතේම එතැනට පැමිණෙන C නැමති පුද්ගලාය B ඝාතනය කිරීමේ වරදට අපරාධකරු ලෙස පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලබයි. එහිදී C අත පිහියක් ද වේ. එය පොලීසියේ සැකය තවත් තහවුරු කරයි.

මේ නිසා C අපරාධකරු යැයි සිතා ඔහුට දඬුවම් පමුණු වීම යුක්ති සහගත වේද ?

අපරාධ කරන පුද්ගලයන්ට දඬුවම් පැමිණ වීමේදී අනුගමනය කරන දඬුවම් ක්‍රම රාශියක් පිළිබඳව සමාජ දර්ශන හා ආචාර ධර්ම ග්‍රන්ථ වල ඇතුළත් කර ඇත.

- ප්‍රතිඵලාත්මක වාදය
- නිවරණාත්මක වාදය
- උපයෝගිතා වාදය
- ප්‍රතිසංස්කරණ වාදය

මෙම වාදයන් අතුරෙන් ප්‍රථමයෙන් ම ඉදිරිපත් කරනු ලැබූ ප්‍රතිඵලාත්මක වාදය පැරණි දඬුවම් ක්‍රම සිහිගන්වයි. මෙහිදී වරදකරුවා විසින් සිදුකරනු ලැබූ වරදේ ප්‍රමාණයට ම දඬුවම් පැමිණවීම මින් අදහස් කරයි. විශේෂයෙන් පැරණි ගිවිසුමේ සඳහන් වන "ඇසට ඇසකි" "දැතට දැතකි" යනාදී ප්‍රතිපත්ති මින් ප්‍රකට කරන බව සැලකිය යුතුය.

කරන ලද වරදේ ප්‍රමාණයටම දඬුවම් පැමිණවීම අතීත ගෝත්‍රික සමාජවල දඬුවම් ක්‍රම සිහිපත් කරන්නකි. මෙවැනි පෞරාණික ම්ලේච්ඡ දඬුවම් ක්‍රමයක් නූතන සමාජ වලට කෙසේ ගැළපෙන්නේ ද යන්න ගැටලුවකි. මෙහි මූලික වශයෙන් ඇත්තේ පළිගැනීමේ චේතනාවක් බව දාර්ශනික මතයයි.

උදා :- කාලයක් තිස්සේ හතුරුකම් පවත්වන P හා Q කණ්ඩායම් 2 කි. P කණ්ඩායම විසින් Q කණ්ඩායමේ සාමාජිකයෙකු ඝාතනය කරයි. එසේ නම් මේ සඳහා වන දඬුවම වන්නේ Q කණ්ඩායම විසින් ද P කණ්ඩායමේ සාමාජිකයෙකු ඝාතනය කිරීමයි.

නිවරණාත්මක වාදය දඬුවම් ක්‍රම අතර වැදගත් එකකි. මෙමඟින් සිදු කරනුයේ වරදකරුවාට දඬුවම් පමුණුවා එමඟින් සෙසු සමාජයට ආදර්ශයක් ලබා දීමය. මේ නිසා වැරදිකරුවාට දඬුවම් දීමෙන් අන්‍යයන් එම වරදින් වළක්වන අතර එවැනි වැරදි කිරීමට අධෛර්යමත් කරවයි. වරදකරුවාට සිදුවන දෙය මෙහිදී වැදගත් නොවේ. වැදගත් වන්නේ දැනට සමාජයේ සිටින පුද්ගලයින් සකසා ගැනීමයි. ආචාරවාදීන් දක්වන ආකාරයට මෙම වාදය මඟින් පුද්ගලයාගේ පෞද්ගලික සොම්නස අගය නොකරයි. ඊට හේතුව මෙහි මූලික පරමාර්ථය සමාජයට ආදර්ශයක් ලබාදීම බැවිනි. මේ නිසා පුද්ගලයා වැරදි කිරීමට බියවේ.

උදා :- යම් පුද්ගලයෙකු ස්ත්‍රී දූෂණය සඳහා වැරදිකරුවෙකු වූ විට බරපතල වැඩ සහිතව ජීවිතාන්තය දක්වා හෝ වසර ගණනාවක් දක්වා ඔහු සිරභාරයට ගනී.

මේ සංදර්භය දකින වෙනත් පුද්ගලයින් මේ නිසා මෙවැනි වැරදි කිරීමට බිය වී ඒවායින් වළකී.

උපයෝගිතා වැදයෙන් දක්වන්නේ වරදක් කිරීම නිසා ඇති වූ අලාභය හෝ පාඩුව මකා ගැනීම උදෙසා දඬුවම් දිය යුතු බවයි. මේ පිළිබඳව ජෙරමි බෙන්තම් දක්වන්නේ,

"අනාගතයේ වැඩිදෙනාගේ යහපත අරමුණු කරගෙන වරදකරුට දඬුවම් කළ යුතු බවයි."

ප්‍රතිසංස්කරණ වාදය මඟින් ඉදිරිපත් කරන්නේ වරදකරුවාගේ චරිත ශෝධනයට අවස්ථාවක් ලබාදී ඔවුන් නැවත සමාජයට අර්ථවත් පුද්ගලයන් ලෙස සකස් කර ගත යුතු බවය. වර්තමාන සමාජයේ බහුල වශයෙන් භාවිතා වන දඬුවම් ක්‍රමය වන්නේ මෙයයි. අද අපරාධකරුවන් දෙස ඉතා සානුකම්පිත වුත්, උපේක්ෂා සහගත වූත් ආකල්පයක් යොමු කිරීමට බොහෝ සමාජ ශෝධකයන් උනන්දු වී ඇත. විශේෂයෙන් ම මේ නිසා බටහිර රටවල් රාශියක මරණීය දණ්ඩනය අත්හිටුවා ඇත. මෙම ක්‍රමය තුළින් අපරාධකරුවන් මරණයට පත් කිරීමට වඩා ඔවුන් නැවත සමාජයේ ඵලදායි පුද්ගලයන් කර ගැනීමට විශේෂ උත්සාහක් දරනු ලැබේ. මේ නිසා දඬුවම් පැමිණ වීම නිසා පුද්ගල යහපත සැලසෙන බැවින් දෙනු ලබන දඬුවම යුක්ති සහගත වන බව පෙනේ.

එසේම ප්‍රතිසංස්කරණවාදීන් දඬුවම් ලෙස චරිතශෝධනය ද අදහස් කරයි. පුද්ගලයා වරදක් කිරීමට හේතු වූ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රතිසංස්කරණ වාදයේ

ලක්ෂණයකි. ඒ සඳහා මානසික, සාමාජික, දේශපාලනික හා ආර්ථික සාධක අතිශයින්ම බලපාන බව පිළිගත් කරුණකි.

උදා :- රැකියා නොමැති වූවකු ජීවත් වීම සඳහා විවිධ අපරාධ වල යෙදීම.

රැකියාවක් නැති නිසා අපරාධයකට පෙළඹෙන්නෙකු එම අපරාධයට දඬුවම් වශයෙන් බන්ධනාගාරයෙන් පිටවන්නේ ඒ තත්වයෙන්ම නම් නැවතත් එවැනි වැරදි වලට පෙළඹීම නොවැළැක්විය හැක. එමනිසා ප්‍රතිසංස්කරණවාදීන් එවැනි පුද්ගලයන් හට බන්ධනාගාර වලින් පිටවන විට යම් රැකියා පුහුණුවක් දීම අය කොට සලකති. එසේ කිරීමෙන් එවැනි පුද්ගලයන් සමාජයට ප්‍රයෝජනවත් පුරවැසියන් කර ගැනීමට මාර්ග පාදා ගත හැක.

මාක්ස්වාදීන් දරන මතයන් නම් සමාජ හා ආර්ථික අසාධාරණකම් පුද්ගලයන් වැරදි වලට පොළඹවන ප්‍රධානතම හේතුවක් බවයි. එම නිසා සමාජ සාධාරනත්වයක් ඇති කර ගැනීම මොවුන් අදහස් කළ ප්‍රධානතම පරමාර්ථයක් වූ බව කිව හැක. එමඟින් අපරාධ සැහෙන දුරට අඩු කර ගත හැකි බව ඔවුන්ගේ මතයයි.

ඇතැම් විට වරදකරුවන් මානසික අසහනයන්ට පත් රෝගී තත්ව වල පසුවන්නන් විය හැක.

උදා :- ගායක ජෝන් ලෙනන් හා ජනාධිපති රොනල්ඩ් රේගන්ට වෙඩි තැබූ පුද්ගලයන් දෙදනාම මානසික රෝගීන් වීම.
කැරල් චෙස්මන් වැනි අපරාධකරුවෝ ද මානසික රෝගීන් වීම.

මේ නිසා අපරාධකරුවන් මෙවැනි රෝගීන් වූ විට ඔවුන් සමාජ අභිවෘද්ධියට අදාළ වන පරිදි සකසා ගැනීමට විශේෂ ප්‍රයත්නයක් දැරිය යුතුය.

මිනිසාගේ මානසික තත්වය පිළිබඳ වඩා තැකීමක් කර ඇති වැදගත්ම දඬුවම් වාදය ලෙස ප්‍රතිසංස්කරණ වාදය හඳුන්වාදිය හැක. වරදකරුවා සංශෝධනය කර ගැනීම පමණක් නොව වරදකරුවාට බලපා ඇති විවිධ සාධක කෙරෙහි ද මෙහි දී තැකීමක් සිදු කෙරේ. එහෙත් මානසික තත්ත්වය ගැන පමණක් තැකීමක් කිරීමෙන් වදකරුවන් ගැන අවබෝධයක් ලබා ගැනීම දුෂ්කරය.

ඉංග්‍රීසි ජාතික ඒ.සී. ඉවිං දක්වා ඇති පරිදි වැරදි කොටස් 2 ට බෙදිය හැක.

- සමාව දිය හැකි වැරදි
- සමාජ නීති රීති මගින් නිශ්චිතව පිළිගැනෙන වැරදි

අපගේ අවධානයට පාත්‍ර වන්නේ දෙවැනි ගණයට අයත් වැරදිය.

උදා : මිනිමැරීම
ස්ත්‍රී දූෂණය
ළමා අපචාර

මේවා සමාජයේ නීතිරීති මගින් නිශ්චිතවම පිළිගැනෙන වැරදි බව දැනගත් විට එවැනි වැරදි වලට පෙළඹීමට ඇති ඉඩකඩ ද සෑහෙන දුරට වළක්වා ගත හැක.

ඉහත දැක්වූ දඬුවම් පිළිබඳ වාද අතුරින් ප්‍රතිසංස්කරණ වාදය අද සෑහෙන දුරට පිළිගැනීමට පාත්‍ර වී ඇත. ඊට හේතුව එය අනෙක් වාදයන් මෙන් නොව චරිත ශෝධනයට අවස්ථාව සලසන බැවිනි. විලියම් ලිලී නම් ආචාරවාදියා පවසන්නේ,

"දඬුවම සදාචාරමය අප්‍රසාදය පළ කරන එක්තරා භාෂා මාධ්‍යයක් බවයි. වැරදි කරන්නන්ට සමාජයේ ප්‍රසාදයක් නැත."

අද සමාජයේ අපරාධකරුවන් උදෙසා දෙනු ලබන දඬුවම් පැරණි ක්‍රම වලට වඩා වෙනස් වී ඇත. දැන් කුඩා කුටි සහිත බන්ධනාගාර වෙනුවට එළිමහනේ වාතාශ්‍රය ඇති හිර කඳවුරු පිහිටුවා ඇත. සිරකරුවන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීමට පියවරගෙන ඇත. එසේම පුනරුත්ථාපන කඳවුරු පිහිටුවා සාමූහික වශයෙන් දඬුවම් කිරීමට වඩා අධ්‍යාපන කටයුතු, ආගමික කටයුතු හා වෙනත් වෘත්තීය කටයුතු වලට අනුග්‍රහය දක්වයි. හැකිතාක් දුරට සාමාන්‍ය පුරවැසියන් ලෙස වරදකරුවන්ට සැලකීමට කටයුතු කරයි. ජනමාධ්‍ය භාවිතයට අවස්ථාව දීම, පවුලේ අය මුණ ගැසීමට අවස්ථා සැලසීම, සිර කඳවුරු වලින් නිවෙස් වෙත ගොස් නැවත පැමිණීම වැනි ක්‍රියා දැන් අනුගමනය කරයි.

මේ අනුව පෙනී යන්නේ නූතන සුභසාධන රාජ්‍යයන් සියල්ලන්ම නීතිය මෙන්ම දඬුවම් ක්‍රමයක අවශ්‍යතාව පිළිගන්නා බවයි. එසේම වැරදි කරන්නවුන් යහපත් පුරවැසියන් බවට පත් කිරීමේ පරමාභිලාෂයක් ද පැවතිය යුතුයි. එම පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා දඬුවම් කිරීමේ දී වුව ද වැරදිකරුගේ මානසික, භෞතික හා සමාජීය සාධකයන් පිළිබඳව ද විශේෂයෙන් සලකා බැලීම අත්‍යවශ්‍ය වේ. දඬුවම මඟින් පුද්ගලයාට එම වැරදි අවබෝධ කරදී ඔහු යහපත්, සමාජයට වැඩදායී පුද්ගලයෙකු බවට පත් කිරීම සිදු කරයි. එබැවින් අපරාධ සම්බන්ධයෙන් දෙනු ලබන දඬුවම යුක්ති සහගත බව පැවසිය නොහැක්කේ ද ?